# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.15 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/614/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**රැඳවුම් නියෝග මත සිටි සැකකරුවෙකුගෙන් අනාවරණය වූ තොරතුරු මත පිස්තෝල අවියක් සොයා ගැනීම - ගාල්ල දිසා අපරාධ කොට්ඨාසය.**

2026.04.10 දින ගාල්ල දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 710 ක් සන්තකයේ තබාගෙන සිටි වඳුරඹ ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බද්දේගම ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර වැඩිදුර විමර්ශනය සඳහා රැඳවුම් නියෝග ලබාගෙන තිබුණි.

සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත වඳුරඹ ප්‍රදේශයේ ඉඩමක සඟවා තිබූ පිස්තෝල අවියක් හා පතොරම් ගැබක් සොයා ගෙන ඇති අතර මොහු සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මෙහෙයවීම මත පහත අපරාධ සිදුකර ඇති බවට වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත.

- 2025.04.03 දින හික්කඩුව පොලිස් වසමේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම.
- 2025.09.01 දින මීටියාගොඩ පොලිස් වසමේදී කාර් රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයින් 04 දෙනෙකුට හා කාන්තාවකට වෙඩි තබා මනුෂ්‍ය ඝාතන සිදුකිරීමට තැත් කිරීම.
- 2025.12.22 දින අම්බලන්ගොඩ පොලිස් වසමේදී පුද්ගලික ආයතනයක කළමනාකරුවෙකු ඝාතනය කිරීමේ අපරාධයට අදාලව අවි ප්‍රවාහනය කිරීම හා ඝාතනයට පැමිණි සැකකරුවන් හට පලා යාමට පහසුකම් සැලසීම.

සැකකරු 2026.04.15 දින බද්දේගම ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2026.04.28 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

ගාල්ල දිසා අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදුකරයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

**தடுத்து வைத்து விசாரணைகள் மேற்கொள்ளப்பட்டு வந்த சந்தேகநபரிடமிருந்து கிடைத்த தகவலின் அடிப்படையில் துப்பாக்கி ஒன்று கைப்பற்றப்பட்டுள்ளது. - காலி பிராந்திய குற்றப் பிரிவு.**

2026.04.10 அன்று காலி பிராந்திய குற்றப்பிரிவு அதிகாரிகள் குழுவினால் ஐஸ் போதைப்பொருள் 21 கிராம் 710 மில்லிகிராம் வைத்திருந்ததாக வன்துரம்ப பகுதியைச் சேர்ந்த சந்தேகநபர் கைது செய்யப்பட்டு, பத்தேகம நீதிமன்றத்தில் முன்னிலைப்படுத்தப்பட்டு மேலதிக விசாரணைக்காக தடுத்து வைத்து விசாரணைகள் மேற்கொள்ள உத்தரவு பெறப்பட்டது.

சந்தேகநபரிடமிருந்து கிடைத்த தகவலின் அடிப்படையில் வன்துரம்ப பகுதியில் உள்ள ஒரு நிலத்தில் மறைத்து வைக்கப்பட்டிருந்த ஒரு கைத்துப்பாக்கு மற்றும் ஒரு மேகசின் கண்டுபிடிக்கப்பட்டுள்ளது. சந்தேகநபர் திட்டமிடப்பட்ட குற்றவாளியின் வழிநடத்தலின் கீழ் கீழ்க்கண்ட குற்றங்களில் ஈடுபட்டதாக விசாரணையில் தெரியவந்துள்ளது:

• 2025.04.03 அன்று ஹிக்கடுவ பொலிஸ் வரம்பில் துப்பாக்கிச் சூடு நடத்தி மனிதக் கொலை செய்தல்.

• 2025.09.01 அன்று மிதியகொட பொலிஸ் பிரிவில் காரில் பயணித்த 4 பேர் மற்றும் ஒரு பெண்ணை நோக்கி துப்பாக்கிச் சூடு நடத்தி கொலை முயற்சி செய்தல்.

• 2025.12.22 அன்று அம்பலாங்கொட பொலிஸ் பிரிவில் தனியார் நிறுவன முகாமையாளரை கொலை செய்த சம்பவத்தில் ஆயுதங்களை கடத்துதல் மற்றும் தாக்குதலாளர்களுக்கு தப்பிச் செல்ல உதவுதல்.

சந்தேகநபர் 2026.04.15 அன்று பத்தேகம நீதிமன்றத்தில் முன்னிலைப்படுத்தப்பட்டு 2026.04.28 வரை விளக்கமறியலில் வைக்கப்பட்டுள்ளார்.

மேலதிக விசாரணைகள் காலி மாவட்ட குற்றப்பிரிவால் மேற்கொள்ளப்படுகின்றன.

பொலிஸ் ஊடகப் பிரிவு.